# සාම්ප්‍රදායික
## ගෘහ නිර්මාණ හා ඉදි කිරීම් ක්ෂේත්‍රය
## (Architechture and Construction Sector)

ඔබ ගොඩනැගිලි සැලසුම් සැකසීමට කැමතිද? ඔබ ඉදිකිරීම් ආශ්‍රිත විවිධ ක්‍රියාකරකම්වලට කැමති ද?

ගෘහ නිර්මාණ ශිල්පය සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුද්ගලයෝ ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහ මත වැඩ කරති. මෙයට අධිවේගී මාර්ග, පාලම්, නිවාස සහ ගොඩනැගිලි ඇතුළත් වේ. ඔබට නව ව්‍යුහ සඳහා සැලසුම් නිර්මාණය කළ හැකි ය. නැත හොත් එය ගොඩ නැගීමට හෝ ව්‍යාපෘතියේ සේවකයන් කළමනාකරණය කිරීමට ඔබට සැලසුම් භාවිත කළ හැකි ය. සමහර ගෘහ නිර්මාණ ශිල්පය සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුද්ගලයන් වඩු වැඩ, පින්තාරු කිරිම හෝ ජලනල කාර්මික ශිල්පයවලට දක්ෂතා පෙන්වති. උදාහරණ වශයෙන් ඔබට අලුත්වැඩියා කරන ලද කාර්යාල අවකාශයක් සඳහා විදුලි වැඩ සියල්ල ම කළ හැකි ය. එසේත් නැතිනම් ඔබට භූමි අංලකරණ ශිල්පයෙකු ලෙස වැඩ කළ හැකි අතර මල් සහ ගස් රැකබලා ගත හැකිය.

**ගෘහ නිර්මාණ හා ඉදි කිරීම් ක්ෂේත්‍රයේ රැකියා/ වෘත්ති,**

**1. ගෘහ නිර්මාණ ශිල්පී**
නිවාස, කාර්යාල ගොඩනැගිලි හා අනෙකුත් දේපල ඇතුළු ගොඩනැගිලි සැලසුම් කිරිම හා නිර්මාණය කරන්නා.

**2. ගොඩනැගිලි හා නිවාස සඳහා සැලසුම් ඇඳීමේ ශිල්පී**
නිවාස හා ගොඩනැගිලි සඳහා වාස්තු විද්‍යාත්මක ව පරිගණක අශ්‍රයෙන් සැලසුම් ඇඳිම.

**3. බොයිලේරුකරු**
බොයිලේරු පද්ධති සැදිම හා නඩත්තු කිරීම.

**4. වඩු කාර්මික**
ලිවලින් සාදන සවි කිරීම් ස්ථාපනය කිරිම් හෝ අලුත් වැඩියා කිරිම් සිදු කිරීම.

**5. සිවිල් ඉංජිනේරු/ තාක්ෂණවේදී**
ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කිරිම, නිර්මාණය කිරිම හා ඉදිකිරීම් අධීක්ෂණය.

**6. වාණිජ කිමිදුම්කරු**
උපකරණ අලුත්වැඩියා කිරිම හෝ ස්ථාපනය කිරිම සඳහා ජල මතුපිටට පහළින් වැඩ කරන්නා.

**7. ඉදිකිරීම් කළමනාකරු**
ගොඩනැගිලි හා නිවාස ගොඩ නැගිම හෝ නඩත්තු කිරිම සම්බන්ධ සියලු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**8. ඉදිකිරීම් හා නඩත්තු පින්තාරු කරන්නා**
බිත්ති, උපකරණ, ගොඩනැගිලි, පාලම් වැනි විවිධාකරයේ පෘෂ්ඨයක්ගේ තින්ත ආලේප කිරීම.

**9. පිරිවැය ඇස්තමේන්තු කරන්නා**
විවිධ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පිරිවැය ඇස්තමේන්තු සකස් කරන්නා.

**10. දොඹකර සහ කලුණු ක්‍රියාකරුවන්**
ද්‍රව්‍ය එසවීම සඳහා යාන්ත්‍රික දොඹකර ක්‍රියාත්මක කරන්නා.

**11. සිවිලින් හා ටයිල් ස්ථාපකයන්**
ගොඩනැගිලවල සිවිලිම් සවිකිරීම හා ටයිල් අතුරන්නා.

**12. විදුලි කාර්මිකයන්**
නිවාස සහ ගොඩනැගිලිවල විදුලි රැහැන් සවි කිරිම සහ අලුත්වැඩියා සිදු කිරීම